astrologer.lk
Astrologer - Prabhath Karunanayaka

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 3 | 1 | (ශ) 11 | | ර 2 | ශු | ගු කේ |
| රා | ධනු ලග්නය | කේ | | ච | මිතුන නවාංශ | 10 |
| ගු ච | බුශු | කුර 9 | | රා කු | 7 | (ශ) බු |

Date: XXXXX
Time: XXXX pm
Time Zone: 5:30:00 (East of GMT)
Place: 80 E 23' 00", 6 N 40' 00"
Ratnapura, Sri Lanka

Lunar Yr-Mo: Prabhava - Ashadha
Tithi: Krishna Dwadasi (Bu) (9.69% left)
Vedic Weekday: Wednesday (Bu)
Nakshatra: Mrigasira (Ma) (62.75% left)
Yoga: Dhruva (Ke) (46.78% left)
Karana: Taitula (Bu) (19.38% left)
Hora Lord: Guru (5 min sign: Kanya)
Mahakala Hora: Guru (5 min sign: Simh)
Kaala Lord: Mangala (Mahakala: Mangala)
Sunrise: 6:01:26 am Sunset: 6:28:16 pm
Janma Ghatis: 26.4405 Ayanamsa: 23-40-03.53 Sidereal Time: 12:26:13

| Body | Longitude | Nakshatra | Pada | Rasi | Navamsa |
|---|---|---|---|---|---|
| Lagna | 9 Dhanu 41' 09.46" | Mool | 3 | Dhanu | Mith |
| Surya - GK | 5 Kark 27' 45.64" | Push | 1 | Kark | Simh |
| Chandra - AK | 28 Vrish 17' 59.67" | Mrig | 2 | Vrish | Kanya |
| Mangala - PiK | 16 Kark 23' 32.73" | Push | 4 | Kark | Vrisch |
| Budha - PK | 16 Mith 04' 24.51" | Ardr | 3 | Mith | Kumbh |
| Guru - DK | 4 Mesh 46' 19.53" | Aswi | 2 | Mesh | Vrish |
| Sukra - AmK | 26 Mith 43' 38.61" | Puna | 3 | Mith | Mith |
| Sani (R) - BK | 21 Vrisch 28' 22.57" | Jye | 2 | Vrisch | Makar |
| Rahu - MK | 12 Meen 06' 24.17" | UBha | 3 | Meen | Tula |
| Ketu | 12 Kanya 06' 24.17" | Hast | 1 | Kanya | Mesh |

Vimsottari Dasa: Maha Dasas:
Mang: 1987-7 -22 - 1991-12-13
Rah: 1991-12-13 - 2009-12-12
Guru: 2009-12-12 - 2025-12-12
Sani: 2025-12-12 - 2044-12-12
Budh: 2044-12-12 - 2061-12-13
Ket: 2061-12-13 - 2068-12-13
Sukr: 2068-12-13 - 2088-12-13
Sury: 2088-12-13 - 2094-12-13
Chan: 2094-12-13 - 2104-12-14

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

විවාහ ප්‍රමාදය

ඔබගේ විවාහය සඳහා තරමක ප්‍රමාදයක් ජන්ම පත්‍රය තුල යෙදේ.සඳු වෙත සෙනසුරු ගේ දෘෂ්ටිය ඇති වීමද දෙවැන්න හිමි සෙනසුරු දොලොස්වැන්න මත යෙදීමද සිකරු සයවැන්න හිමියා ලෙස සත්වැන්න මත යෙදීමද ගුරු ගේ දෘෂ්ටිය සත්වැන්න හිමියා ,සත්වැන්න මෙන්ම සිකුරු වෙත යෙදීමද මෙයට හේතු විය හැකියි.දොලොස්වැන්න හිමි වන කුජ අටවැන්න මත යෙදීමද විවාහයට පීඩාකාරී තත්වයන් වේ.නමුත් ඔබ වෙතට යහපත් වු විවාහයක් පිණිස උරුමයක් යෙදිය හැකියි.

ඔබ වෙත 2014 නොවැම්බර් තෙවැනි දින දිනයේ සිට උදාව පවතින සෙනසුරු ලග්න ඒරාෂ්ඨක තත්වය නිසා ඉදිරිපත් වු යොජනාවන්ද අවසාන අවස්ථාවේදී යම් හේතු මත ඉවත් විම් ආදියද සමහර යහපත් යොාජනා කෙරෙහි ඔබ සිත ඇදි නොයාමද මෙම ග්‍රහ තත්වයන් මත හේතු විය හැකියි.කෙසේ නමුත් යම් යම් කාලවලදී ඔබ සිත්ගත් අය හමු වුවද එම කටයුතු යම් හේතු මත හා ඔබ සිතේ පවත්නා උසස් දේ සෙවිමේ අදහස මත ඉවත්ව ගිය අවස්ථාවන්ද ඇති විය හැකියි.

ඔබගේ විවාහය සඳහා මෙම ගතවන කාලය තුලදී උනන්දුවිම යහපත් වන අතර මෙම වසරේ ජුලි මාසයත් නොවැම්බර් මාසයත් අතර කාලය විවාහය කෙරෙහි යම් ස්ථිරත්වයක් පිලිබඳව කරුනු ඇති විය හැකි කාලයකි.මෙම කාලය තුලදී එම කටයුතු සිදුනොවන හොත් නැවත සුදසු කාලයක් 2017 ඔක්තෝම්බර් සිට 2018 අප්‍රෙල් අතර කාලයේදී වේ.නමුත් පවතින සෙනසුරු අපලකාරී තත්වය නිසා මෙම කටයුතු කෙරෙහි ප්‍රමාදයන් හෝ කඩවිම් යෙදීමේ ඉඩකඩද ඇති නිසා පහත දක්වා ඇති වත් පිලිවෙත් ආදියෙහි යෙදීම වඩාත් යෝග වන අතර තමා වෙත යහපත් විවාහයක් හිමි වේවා යන අදහසින් හා දැඩි ප්‍රාර්තනයෙන් යුක්ත්ව එම වත් පිලිවෙත් ආදියෙහි යෙදීම වඩාත්ම සුදසු වනු ඇති.

ඔබට ඉහත සඳහන් කල පරිදි යහපත් විවාහයක් පිලිබඳව බලාපොරොත්තු හිමි කර ගත හැකියි.නමුත් විවාහය පත්වාගෙන යාමේදි අන්‍යෝන්‍ය වශයෙන් යම් අවබෝධයකින් යුක්තව කටයුතු කීරිම වඩාත් යහපත් වනු ඇති.සහකාරියේ අවශ්‍යතා හා සිතුවිලි හඳුනාගෙන කටයතු කීරිම වඩාත් සුදසු වනු ඇති.ඔබට දරුපල හිමියි.ඔබගේ ජන්ම පත්‍රය අනුව පිරිමි දරුවන් කෙරෙහි වැඩිපුර අවස්ථාව යෙදුනද සහකාරියගේ ජන්ම පත්‍රයේ තත්වය අනුව යම් වෙනස් විය හැකි අවස්ථා යෙදේ.හිමි වන සහකාරිය ඔබට වඩා තරමක් වයසින් අඩු තැනැත්තියක් විය හැකියි.එසේ නොමැති නම් වයස තරමක් අඩුවෙන් පෙනෙන අයෙක් විය හැකියි.කලාකාමි අයෙකි.විනෝදයට රුචි


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

අයෙකි.පරිපාලන, මුල්‍ය, පරිගනක වැනි කටයුත්තක් ඇයට හිමි වනු ඇති.කාර්ය සූර්ය බවින් යුතුයි.ඇතැම් විට ඔබගේ මිතුරෙකු හො නෑදැයෙකු මාර්ගයෙන් හෝ ඒ සබදතාවක් මත විවාහයට මං පෑදිය හැකියි.

ඔබගේ ජන්ම පත්‍රයේ කුජ අටවැන්න මත යෙදිම හෞම දෝෂයක් වුවත් කුජ සිටින්නේ කටක රාශියෙහි වීම මත එම දෝෂය ඉවත්ව යනු ඇත.

ඔබට හිමි වන හෝ ඔබ උපයා ගන්නා දේපොල නිතිමය වශයෙන් හා වෙනත් කරුණු ඇසුරෙන් පිරිසුදුව හා ආරක්ෂා සහිතව නිසා සොයාබැලිම් ආදියෙන් යුත්තව පවත්වාගෙන යාම වඩාත් යෝග්‍ය වනු ඇති.යාන වාහන ආදිය හිමි විය හැකියි.බොහෝවිට උපන් ප්‍රදේශයෙන් පිටදී ඔබට දියුණුව යෙදෙනු ඇති.රැකියාවේ යම් යම් අවස්ථාවලදී කුමන්ත්‍රණ ආදිය යෙදිය හැකි නිසා කල්පනා කාරීව කටයුතු කරන්න.ඔබගේ කැපවීම හා උත්සාහ ජීවිතයේ දියුණුවටම හේතු වනු ඇත.සෙම් ආශ්‍රිත පීඩා ,ආශ්‍රිත පීඩාවන් , මුත්‍රා අමාරු ,වෙනත් සිරුරේ යට ප්‍රදේශයේ පීඩාවනද් යෙදිය හැකියි හා අනතුරු ධන හානි ඔබට යෙදිය හැකි නිසා මෙම උදාව ඇති අපලකාලයෙදී එදිනෙදා කෙරෙන කටයුතු ආදියෙන් ප්‍රවේශම් විම සුදසුයි.පහත දැක්වෙන වත් පිලිවෙත් ආදිය විවාහ ප්‍රමාදයටත් සෙසු අපලකාරී තත්වය කෙරෙහිත් යහපත් වනු ඇති.

අපල සඳහා වත් පිලිවෙත්

1 බෝධි පුජා පවත්වා විෂ්ණු - කතරගම - සුමන සමන් - ගම්භාර - ී පත්තිනි ආදි සියලුම දෙවියන්ට පින් අනුමෝදනාකර සියලුම දෙවින්ගේ දේව ආශීර්වාදයෙන් තම අපල දුරු වී සෙතක් ශාන්තියක් ලැබේවා යැයි ප්‍රාර්ථනා කිරීම යහපත්ය.

2 සෙනසුරාදා දිනවල උදේම ගිතෙල් මිශ්‍ර කරන ලද කිරිබත් ගුලි නමය බැගින් කපුටන්ට දන් දීම යහපති.

3 ගුණ යහපත් වැඩිහිටි අයට සුදුසු සංග්‍රහයක් කර ඔවුන්ගේ ආශීවාදය ලබා ගැනීම යහපත් ය.( වැඩිහිටි නිවාසයකට දානයක් දීම වුවත් යහපත් ය .)

4 නිල්මහනෙල් මල් හා රතු නෙලුම් බෝධියකට පුජා කරන්න.

5විෂ්ණු දෙවියන් වෙතට වසර 2025 තෙක් බාරවී බාරය වශයෙන් වර්ෂයට අළුත් කරවා ගන්න.


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

6 නිවසේ බුදුන් වහන්සේට මල් - සුවඳ - පහන් පුජා කර සියලුම දෙවියන්ට පිං අනුමෝදනා කර සියලුම දේවියන්ගේ ආශීර්වාදයෙන් සෙතක් ශාන්තියක් ලැබේවා යනුවෙන් ප්‍රාර්තනා කිරීම යහපත් ය.

7 නිවසේ කරණීය මෙත්ත සූත්‍රය ",ජය පිරිත , අභිසම්භිදාන සූත්‍රය සද්ගායනා කිරීම යහපති.

8 විවාහය ප්‍රමාද වීම් සඳහා පහත දැක්වෙන ගයාත්‍රී මංන්ත්‍රය දිනපතා උදේ ආගමික වතාවත් ආදියෙන් පසුව තමාගේ විවාහය සඳහා යහපත් සහකාරියක නියමිත වයසේදී හිමිවේවා යන තිර අදිටනින් යුතුව එකොලොස් වරක් කියවීම යහපති.

ඕම් කාම දේවාය - විද්මහේ

පුෂ්ප බානාය ධීමහී - තනෝ නාග ප්‍රචෝදයාත්

9 විෂ්ණු ,කතරගම්, ගම්බාර, සත්පත්තිනි දෙවි දේවතාවන් නිතර සිහිකරමින් තමට ආරක්ෂාව ,පිහිට ලබා දෙන ලෙස ඉල්ලා සිටින්න.

10 ඕම් ත්‍රෙයම්බකම් යජාමහේ - සුගාඩිම් පුෂ්ඨී වර්ධනං -

උරුවාරු කම්ම බන්ධනාත් - මෘත්‍යෝර් මුක්ෂීය මාමෘතාක්

අපගේ වෙබ් අඩවියෙන් මෙම ස්ත්‍රොත්‍රය ශ්‍රවණය කර නිසි උච්චාරණය දැන දවසේ ඕනෑම අවස්ථාවකදී නිසි ගෞරවය සහිතව ශිව දෙවියන් සිහිකර කියවීම සුදුසුයි.

11 සෙත් කවියක් යහපත් විවාහයක් පිණිස පත්තිනි මෑණියන් විෂයෙහි කියවීම ශුභයි.

12ආබාධිත යාචක අයට තමාට හැකි අවස්ථා වලදී ආහාර හෝ සුදුසු යමකින් සංග්‍රහ කරන්න

13දරුවන් සිටින ආර්ථික අපහසතා ඇති පවුලකට ඔබගේ හැකි ආධාරයක් ලබා දෙන්න

14 කුඩා දරුවන් සඳහා සංග්‍රහ පැවැත්වීම ,දරුවන් ඇසුරේ සිටීම ,දරුවන් සිටින අනාත නිවාස ආදියට උපකාර ලබා දීමද සුදුයි.

"බුදු සරණින් සියලුම දෙවි පිහිටෙන් ඔබගේ සියලු අපල දුරුවී ඔබට සෙතක් ශාන්තියක් යහපතක් ම වේවා".යනුවෙන් අපිද ප්‍රාර්තනය කරමු

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com